ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ
මාධ්‍ය නිවේදනය

Public Affairs Section
Tel:  +94 (1) 249-8100 ● Fax:  +94 (1) 244-9070
Email: ShenJY@state.gov ● http://lk.usembassy.gov/

Release No. 20170712

## ඇමෙරිකාවේ නව නිර්මාණ විශේෂඥයින් ශ්‍රී ලාංකික තොරතුරු තාක්ෂණඥයින් සමග අත්වැල් බැඳගනී

**ජූලි 12 කොළඹදී ය** ශ්‍රී ලංකාව හා එක්සත් ජනපදය අතර ආර්ථික සම්බන්ධතා තවදුරටත් වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයක් ලෙසින් ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය තොරතුරු තාක්ෂණ නව නිර්මාණ විශේෂඥයකු වන චෙරිල් එඩිසන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම තොරතුරු තාක්ෂණ ව්‍යාවසායකයින්ට, ඉංජිනේරු ශිෂ්‍යයින්ට සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයේ (ICTA) නියෝජිතයින් සමග සම්බන්ධ කරලීමට කටයුතු කරනු ලැබීය. එමෙන්ම මෙම වසරේ පැවැත්වූ ඩිස්රප්ට් ඒසියා (Disrupt Asia) සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශකයා වශයෙන් කටයුත කලේද එඩිසන් මහත්මියයි.

“උපායමාර්ගික වශයෙන් වැදගත් ස්ථානයක පිහිටා තිබීමත් කුශලතාවන්ගෙන් හෙබි කැපීපෙනෙන මානව සම්පතත් නිසා නවීනතම තොරතුරු තාක්ෂණ සහ ආර්ථික මධ්‍යස්ථානයක් වශයෙන් සාර්ථකත්වයට පත්වීමට ශ්‍රී ලංකාවට කදිම අවස්ථාවක් තිබෙනවා. ආර්ථික සෞභාග්‍ය උදාකරගැනීමට ශ්‍රී ලංකාව දරණ උත්සාහය සාර්ථක කරගැනීමට ඇමෙරිකානු විශේෂඥයින්ගේ සහාය ලබාදීමට හැකිවීම පිළිබඳව අපි ආඩම්බරයට පත්වෙනවා ” යැයි එක්සත් ජනපද තානාපති කාර්යාලයේ රොබර්ට් හිල්ටන් මහතා පැවසීය.

එඩිසන් මහත්මිය ශ්‍රී ලංකාවේ සංචාරය කළ දින අටක කාලසීමාව තුළ ඇය යාපනය සහ කොළඹ ප්‍රදේශ වලදී ව්‍යවසායකයින් මුණගැසී ව්‍යාපාරික අරමුණු දිනාගැනීමටත් ශ්‍රී ලංකීය නිෂ්පාදන කළාපීය සහ ලෝක මට්ටමින් අලෙවි කරගැනීමත් සඳහා වූ උපායමාර්ගික දැනුම ලබාදීමට කටයුතු කළාය. එඩිසන් මහත්මිය සිලිකන් වැලි සමාගමේ Silicon Valley ව්‍යාපාරික සංවර්ධන විශේෂඥවරියක් වන අතර වොල්වෝ, වෝනර් බ්‍රදර්ස්, කැරේෆෝර් සහ රෙව්ලොන් වැනි සමාගම් ඇතුලුව ලොව පුරා ප්‍රමුඛ සමාගම් රැසක ව්‍යාපාර සංවර්ධන කටයුතු වල සාර්ථකව නියැලී තිබේ.

“නව අපේක්ෂාවන්ගෙන් සපිරුණු යාපනයේ ව්‍යවසායකයින් උනන්දු කරලීමට චෙරිල් අපට උපකාරී වූවා. එසේම ඇය අපි අපගේ නිර්මාණ සංවර්ධනය කරගෙන යාමේදී සිලිකන් වැලි සමාගමේ අත්දැකීම් හා පළපුරුද්ද අප සමග බෙදාහදා ගත්තා” යැයි යාල් අයි ටී හබ් Yarl IT Hub සාමාජිකයකු පැවසීය.

එඩිසන් මහත්මිය යාපනය විශ්ව විද්‍යාලයේ කිළිනොච්චියේ පිහිටි ඉංජිනේරු පීඨයේ සහ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර සහ ඉංජිනේරු අංශ වල සිසුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වූවාය. එසේම ඇයගේ ශ්‍රී ලංකා සංචාරය තුළදී කාන්තා ව්‍යවසායකයින්, ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජිතයින් සහ ශ්‍රී ලංකාවේ පරිගණක මෘදුකාංග හා සේවා සපයන සමාගම් සම්මේලනයේ සාමාජිකයින් හමුවී උපදෙස් ලබාදීමට කටයුතු කළාය. ඩිස්රප්ට් ඒසියා සමුලුවේදී ඇය දේශීය වෙළඳ ව්‍යාපාරිකයින් තොරතුරු තාක්ෂණ නව නිර්මාණකරුවන්ට ජගත් මට්ටමේ යහභාවිතයන් හඳුන්වා දෙමින් ඔවුන්ගේ ව්‍යාපාර තවදුරටත් ව්‍යාප්ත කිරීමට උනන්දු කළාය.

2016 වසරේදී ද එඩිසන් මහත්මිය ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර ඒ අවස්ථාවේදී ඇය කොළඹදී සහ මහනුවරදී නව නිර්මාණකරුවන් සඳහා “Makerspaces” වැඩසටහන එළි දැක්වීමට සහාය දැක්වූවාය. එසේම ඇය ICTA ආයතනය විසින් සංවිධානය කරන ලද Spiralation Tech Startup Support වැඩසටහනේ සහභාගිකයින්ට නොමිළයේ ප්‍රයෝගික පන්ති සහ පෞද්ගලික උපදේශන ලබාදීමට කටයුතු කළාය.

# # #